මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ 49 2023.04.25

**2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන් ලෙස නාමයෝජනා භාර දී ඇති දේශපාලන හිමිකම් ඇති රාජ්‍ය, සංස්ථා නිලධාරීන් වෙනුවෙන් සහන සැලසීම.**

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන් ලෙස නාමයෝජනා භාර දී ඇති දේශපාලන හිමිකම් ඇති රාජ්‍ය, සංස්ථා නිලධාරීන්ට ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි වීම මත හා ඡන්ද විමසීම් කාලය තවදුරටත් දීර්ඝ වීම මත වැටුප් රහිතව සිටීමට සිදු වීමත්, එසේම ඔවුනට හා ඔවුන්ගේ යැපෙන්නන්ට බලවත් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වී ඇති බවත් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි රාශියක් ඉදිරිපත් වී ඇත. මේ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව 2023 04.10 දින ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේ දී ද සාකච්ඡා කළ අතර, එහි දී ඔවුන් වෙනුවෙන් සහන සැලසීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ ඉල්ලා සිටින ලදී. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව මතු සඳහන් නිරීක්ෂණ/ නිර්දේශ ගරු අග්‍රාමාත්‍ය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

01. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන් වශයෙන් ඉදිරිපත් වී සිටි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය/ සංස්ථා/ මණ්ඩල හෝ රජයේ වැටුප් හෝ ප්‍රතිලාභ ලබන ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් වෙත ගෙවීමට තීරණය කරන ලද මූලික වැටුප යන්නෙන් එම නිලධාරීන්ට ගෙවිය යුතු සාමාන්‍ය වැටුප් හා දීමනා (ප්‍රවාහන, දුරකථන සහ පැමිණීම වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනා හැර) අදහස් කරනු ලබන බව;

02. එම අපේක්ෂකයන් ඡන්දය සඳහා ඉදිරිපත් වූ පළාත් පාලන ආයතනවලින් බැහැරව, කොට්ඨාශයෙන් බැහැරව හෝ අපේක්ෂකයාට හිමි ඡන්ද බල ප්‍රදේශයෙන් බැහැරව නැවත සේවයේ යෙදවීම සලකා බැලීම සුදුසු බව;

03. ඡන්ද විමසීම සඳහා නාමයෝජනා බාර දී ඇති අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය මත ඡන්ද විමසීමට අගතියක් සිදු නොවන පිණිස, ඔහුගේ කලත්‍රයා හෝ ළඟම ඥාතියා වෙත ලබා දී ඇති තාවකාලික ස්ථානමාරු වෙනස් කර පූර්ව සේවා ස්ථානයටම අනුයුක්ත කිරීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්